රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 37/2013

මගේ අංක: EST 5/2/16/3
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2013.12.31

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## 2014 අයවැය යෝජනා අනුව රාජ්‍ය සේවයේ ජීවන වියදම් දීමනා සංශෝධනය කිරීම

රජය විසින් 2014 අයවැය යෝජනා මඟින් ප්‍රකාශිත ජීවන වියදම් දීමනාව ගෙවීම පහත සඳහන් පරිදි ක්‍රියාත්මක කළ යුතුය.

02. 2012.12.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 හි 02 ඡේදයේ විධිවිධාන අනුව, දැනට සේවයේ නියුතු රජයේ නිලධරයන්ට ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව, 2014.01.01 දින සිට රු.7800/- ක් වේ.

03. අනියම්/දෛනික වැටුප්ලාභී පදනම යටතේ සේවය කරන සේවකයින්ට 2012.12.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 හි 4:1 උපඡේදය යටතේ ගෙවනු ලබන දෛනික ජීවන වියදම් දීමනාව, 2014.01.01 දින සිට රු. 260/- ක් වේ.

04. ත්‍රිවිධ හමුදා සාමාජිකයන් සඳහා මෙම චක්‍රලේඛයේ 02 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව ජීවන වියදම් දීමනාව ගෙවීම් කළ යුතුය.

05. ගරු අමාත්‍යවරුන්ගේ, ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ද, පළාත් සභාවල ගරු ආණ්ඩුකාරවරු, ගරු ප්‍රධාන අමාත්‍යවරු හා ගරු පළාත් සභා අමාත්‍යවරුන්ගේ අනුමත පෞද්ගලික කාර්ය මණ්ඩලය සඳහා ද කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ හා පළාත් ප්‍රධාන ලේකම්වරුන්ගේ සම්බන්ධීකරණ ලේකම්වරුන් සඳහා ද ඉහත 02 ඡේදයේ සඳහන් විධිවිධාන අනුව ජීවන වියදම් දීමනාව ගෙවිය යුතුය.

06. 2012.12.13 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2012 හි 8:1 උපඡේදයේ විධිවිධාන අනුව විශ්‍රාමිකයින් සඳහා ගෙවනු ලබන මාසික ජීවන වියදම් දීමනාව, 2005.12.31 දින දක්වා රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධරයන්ට 2014.01.01 දින සිට රු.3675/- ක් වන අතර, 2006.01.01 දින ද ඇතුළත්ව එදිනෙන් පසුව රජයේ සේවයෙන් විශ්‍රාම ගිය නිලධරයන්ට රු. 3525/- ක් වේ.

07. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව නිකුත් කරනු ලැබේ.

පී.බී. අබේකෝන්

ලේකම්

රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය